**ශීර්ෂය 410 සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 29 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2021 දෙසැම්බර් 31 දිනට සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බවට,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 21 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදලින් රු. 1,286,515,040 ක් එනම් සියයට 7 ක සිට සියයට 98 ක් අතර පරාසයක ඉතිරිවීම් සිදුවී තිබුණි. | කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම, ලී බඩු හා උපකරණ මිලදී ගැනීම සඳහා ඇණවුම් කළ ද වෙළඳපල තුළ ආනයන සීමා පැනවීම, විදේශ විනිමය ගැටලු, කෝවිඩ් 19 වසංගත තත්ත්වය නිසා වියදම් කළමණාකරණය, වියදම් දැරීමේ අවශ්‍යතාවයන් අඩුවීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවිය. | සලසා ගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කළ යුතුය. |
| (ආ) | මූලධන හා පුනරාවර්ථන වැය විෂයයන් 02 ක ප්‍රතිපාදනය කර තිබුණු රු.460,000 ක සම්පූර්ණ මුදලම භාවිතයකින් තොරව ඉතිරි වී තිබුණි. | කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විදේශීය ගමන් සිදු නොකිරීම, අමාත්‍යාංශයේ නව කාර්යාල පරිශ්‍රය සඳහා ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වියදම් දැරීමේ අවශ්‍යතාවයක් ඇති නොවීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවිය. | සලසා ගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | වැඩසටහන් 2 හි වැය විෂය 2202 - සංවර්ධන සහයන් සඳහා පරිපූරක ඇස්තුමේන්තු මගින් රු. 20,000,000 ක් අනුමත කරගෙන තිබුණත් එම වැය විෂයෙහි ඉතිරිය රු.461,391,566 වීම හේතුවෙන් පරිපූරක ඇස්තුමේන්තුව අනුමත කර ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. | නව අමාත්‍යාංශයක් ලෙස 2020 අගෝස්තු මස පිහිටුවන ලද මෙම අමාත්‍යාංශයේ කටයුතු පවත්වා ගෙන යාමට අත්‍යාවශ්‍ය වූ කාර්යාල උපකරණ හා පරිගණක උපාංග මිලදී ගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන 410-1-2-2102 යටතේ වෙන්වී නොතිබුණ නිසා රු.මි.8.5 ක ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තුමේන්තුවෙන් ඉල්ලීම් කළ අතර ඒ සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දෙන ලදී. 2021 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන වැඩසටහන යටතේ 410-2-3-13-2202 යන විෂය සඳහා රු.මි.20 ක ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තුමේතුව මගින් ලබා දී ඇත. | එක් එක් වැය විෂයන් සඳහා අවශ්‍ය මූල්‍ය ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව සැකසිය යුතුය. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන-iii) සඳහන් කර නොමැති රු.160,007 ක් වූ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවිය යුතු බැරකමක්, 2022 වර්ෂයේ පෙබරවාරි මාසයේදී නිරවුල් කර තිබුණි. | 2021 දෙසැම්බර් මස දුරකථන බිල්පත ප්‍රමාද වී ලැබීම නිසා 2021 මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුලත් කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සකස් කිරීමේ දී සමාලෝචිත වර්ෂයට අදාළ සියලුම බැරකම් එයට ඇතුළත් කිරීමට වගකිව යුතු නිලධාරීන් වගබලා ගත යුතුය. |

**2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයන් ඇති බවට ගණන්දීමේ නිලධාරියා සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවයට අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි. | පුරප්පාඩුව පවතින අභ්‍යන්තර විගණක තනතුර සම්පූර්ණ කර දෙන මෙන් අංක SMTR/2/T&R/12/Vacancies හා 2021.07.22, 2021.09.14 ,2021.10.28 හා 2022.02.03 දිනැති ලිපි මගින් රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ වෙත ඉල්ලීම් ලිපි යොමුකර ඇත. එම පුරප්පාඩුව සම්පූර්ණ නොවීම මත අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත නොවුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා රබර් වතුවල ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම දිරිගැන්වීම තුළින් එම ඉඩම් ලාභදායි වාණිජ ඒකක බවට පත් කිරීම යන සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවල සඳහන්, 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ප්‍රගතිය සහ 2021 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් ලබා කර ගත් භෞතික ප්‍රගතිය අතර අසතුටුදායක විචලනයක් නිරීක්ෂණය විය. | වර්ෂ අවසානය වන විට ඇස්තමේන්තුවල සඳහන් මිලට වඩා ඉදිකිරීම් ද්‍රව්‍ය මිල ඉහළ යාම, ඇතැම් ක්‍රියාකාරකම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන වල ඉතිරියෙන් වෙනත් ක්‍රියාකාරකම් සිදු කිරීම සහ මිල ගණන් කැඳවීමේදී වෙන් කළ මුදලට වඩා ලංසුගත මිල වැඩිවීම, තෝරාගත් ප්‍රතිලාභීන් සියලුදෙනා අදාළ කාර්යයන් නිසි පරිදි සිදු නොකිරීම, ගොවීන්ට මී මැසි ජනපද සපයා ගැනීමේ අපහසුතාවය, ව්‍යාපෘති සඳහා අනුමැතිය ප්‍රමාද වී ලැබීම අවශ්‍ය සිමෙන්ති, බ්ලොක් ගල් සහ කම්බි ආදී ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳපොළෙන් සපයා ගැනීම අපහසු වීම යන කරුණු හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ඉලක්කය සහ 2021 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් ලබා කර ගත් භෞතික ප්‍රගතිය අතර වෙනස්කම් දක්නට ලැබුණි. | සැලසුම් කරන ලද ඉලක්කයට අනුකූලව අදාළ කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ වැවිලි කටයුතු, කඩඉම් සිතියම් සකස් කිරීම වැනි සංවර්ධන ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු කාර්යයන් සම්බන්ධීකරණය සිදු කර ඇත. මේ අනුව අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල සියයට සියයක් මූල්‍ය ප්‍රගතිය පෙන්නුම් කළ සංවර්ධන ව්‍යාපෘති 10 ක්ද, සියයට සියයක් මූල්‍ය ප්‍රගතියක් ලගා කර ගැනීමට අසමත් වූ ව්‍යාපෘති 7 ක්ද පැවති අතර, තේ වගාව සඳහා බිංදු ජල සම්පාදන ව්‍යාපෘතිය කිසිදු මූල්‍ය ප්‍රගතියක් | කාලගුණික විපර්යාස අවම කිරීම සඳහා තේ වතුවල උස් හා මධ්‍ය සෙවණ ශාක ව්‍යාප්ත කිරීම ව්‍යාපෘතියේ රටෙහි පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා අදාළ ආයතනවලට මුළු ඉල්ලීම් සපුරා දීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම.<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව නව තාක්ෂණයට අනුවර්තනය කිරීම ව්‍යාපෘතියේ අවශ්‍ය උපකරණ අනුමත ප්‍රසම්පාදන ක්‍රමයට අනුව මිලදී ගැනීමේදී ඇස්තමේන්තු කර තිබූ මිලට වඩා රුපියලේ අගය අඩුවීම මත ලැබුණු මිල ගණන් වැඩිවීම හේතුවෙන් මෙම | සැලසුම් කරන ලද කාල රාමුව තුළ අදාළ සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණ කළ යුතුය. |

නොමැති ව්‍යාපෘතියක් ලෙස ද පැවතුණි.

උපකරණ මිලදී ගැනීමට නොහැකි විය. නැවත මිල ගණන් කැඳවීමට කාලය ප්‍රමාණවත් නොවීම මත මෙම ව්‍යාපෘතියේ මුදල් ඉතිරි විය.

කුඩා රබර් වතුවල ආදායම් මාර්ග විවිධාංගිකරණය කිරීම දිරිගැන්වීම තුළින් එම ඉඩම් ලාභදායි වාණිජ ඒකක බවට පත් කිරීම යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය ගෘහය සකස් කිරීම සඳහා සිමෙන්ති, බ්ලොක් ගල් සහ කම්බි ආදී ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳපොළෙන් සපයා ගැනීම අපහසු වීම, ගොවීන්ට මී මැසි ජනපද සපයා ගැනීමේ අපහසුතාවය, ප්‍රතිලාභීන් අදාළ කාර්යය නිසි පරිදි සිදු නොකිරීම, බහුකාර්ය කැබලිකරණ යන්ත්‍ර නොමැතිව ක්‍රියාකිරීම, කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පුහුණු වැඩසටහන් නොපැවැත්වීම, ක්ෂේත්‍ර චාරිකා සංවිධානය නොවීම යන හේතූන් ඉතිරිවීම් සඳහා බලපාන ලදි.

දේශීය සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට ස්වභාවික රබර් ආශ්‍රිත කර්මාන්ත සඳහා

සහනාධාර ලබාදීම ව්‍යාපෘතියේ රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා සැලසුම් කළ ආකාරයට කටයුතු කිරීමට නොහැකි වීම හා වෙළඳපල තුළ ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහළ යාම, අමුද්‍රව්‍ය මිල ඉහළ යාම හා ද්‍රව්‍ය හා උපකරණ හිඟ වීම මත ප්‍රතිපාදන ඉතිරි විය.

තේ වගාව සඳහා බිංදු ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතියේ රටේ ව්‍යාප්තව පැවති කොරෝනා වසංගත තත්ත්වය හා ආදායම් මාර්ග අඩපණ වීම නිසා ප්‍රතිලාභීන් වැඩි පිරිසක් මේ සඳහා දායකත්වය ලබා නොදුණි. ආනයන සීමා හේතුවෙන් ජල මෝටර් සහ ජල නල සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබු ආයතන වලට එම උපකරණ සැපයීමට නොහැකි බව දැන්වූ බැවින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි

විය.

රබර් මහා සැලැස්ම ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතියේ රටේ පවතින කොවිඞ් 19 වසංගත තත්ත්වය හමුවේ ක්ෂේත්‍ර පරීක්ෂණ ප්‍රමාද වීමෙන්, වගා කන්නයේදී අවශ්‍ය බීජ මිලදී ගැනීමට නොහැකි වීම, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හා රබර් වෙන්දේසි පැවැත්වීමට නොහැකි වීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි විය. තවද කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම නිසා ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් වූ රු.මි.10 න් රු.මි.4.2 ක් ඉතිරි විය.

කෑගල්ල හා ගාල්ල ප්‍රාදේශීය කාර්යාල නවීකරණ ව්‍යාපෘතියේ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු රු.මි.49 තුළ ඉටු කර ගන්නා ලෙස දැන්වූ බැවින් රු.මි.21 ඉතිරි විය.

ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ පාලනය වන වතු ඉඩම්වල කැඩැස්තර මැනුම් කටයුතු සිදුකර කඩයිම් සිතියම් සකස් කිරීම ව්‍යාපෘතියේ 2021 වසර සඳහා මැනුම් කරන ලද වතුවල කණු සිටුවීම සඳහා රු.මිලියන 90 ක මුදලක් වෙන්ව තිබුණි. ඒ අනුව දැනට මැන ඇති වතු 130 ක් සඳහා මායිම් කණු නිෂ්පාදනය හා ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් අදාළ බදු මුදල්ද ඇතුළත්ව රුපියල් මිලියන 269.8 ක වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව උක්ත කාර්යය ප්‍රාදේශීය මට්ටමින් ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් ඉටු කර ගන්නා ලෙස 2021.09.22 දිනැති හා අමප/21/1499/326/035 අංක දරන තීරණය මගින් අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව උක්ත කාර්යය සඳහා වෙන් කරන ලද රු. මි. 90 ක මුදල ඉතිරි විය.

**3.2.** **වෙනත් නිරීක්ෂණ**

**3.2.1** **රජය සතු වතු ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු දීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය වැවිලි සමාගම් 20 ක් මඟින් අය කර ගත යුතු 2021 වර්ෂයේ වාර්ෂික බදු කුලී ආදායම රු. 1,082,869,913 ක් වන අතර 2021 වර්ෂයට අදාළව එකතු කරන ලද බදු කුලී ආදායම රු. 769,912,476 ක් විය. එය 2021 වර්ෂයට එකතු කිරීමට අපේක්ෂිත බදු ආදායමෙන් සියයට 71 ක් විය. 2021 වර්ෂයට අදාළව වැවිලි සමාගම් 09 ක් විසින් ගෙවිය යුතු හිඟ බදු මුදල රු. 312,957,437 කි.කොටගල වැවිලි සමාගම සහ මස්කෙළිය වැවිලි සමාගම විසින් 2021 වර්ෂයට අදාළව ගෙවිය යුතු වාර්ෂික බදු කුලියේ එකතුව රු.143,195,155 කි. එම අගය 2021 වර්ෂයට අය කර ගත යුතු වාර්ෂික මුළු බදු කුලී මුදලින් සියයට 46 ක අගයකි. | 2021 දෙසැම්බර් 31 දිනට හපුගස්තැන්න වාරිකයක්, බලංගොඩ වාරිකයක්, බොගවන්තලාව වාරික දෙකක්, කැලණිවැලි වාරිකයක්, හලාවත වාරික තුනක් හා මතුරට වාරිකයක් වශයෙන් හිඟව ඇත. 2022 ජූනි 30 දින වන විට වැවිලි සමාගම් වෙතින් හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කර ඇත. මස්කෙලිය වැවිලි සමාගම විසින් 2021 වර්ෂයට අදාළව ගෙවිය යුතු හිඟ බදු මුදලින් රු. 22,284,630 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, ඉතිරි හිඟ බදු මුදල් ගෙවීම් කරන ලෙස මස්කෙලිය වැවිලි සමාගම වෙත ලිඛිතව දන්වා ඇත. | ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් කඩිනමින් අදාළ බදු මුදල් සියල්ල අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි අවම ලැබීම් සීමාව රු.5,000,000 ක් ලෙස අනුමතව තිබී පසුව එය රු.1,800,000 ක් ලෙස සංශෝධනය කර ඇති නමුත්, එම සංශෝධනයන් කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල (SA- 52) තවදුරටත් එය රු.5,000,000 ක් ලෙස පැවතුණි. | අපේක්ෂිත ආකාරයට ණය මුදල් ඉල්ලුම් නොකිරීම නිසා මු.රෙ. 503 අනුව ලැබීම් සීමාව රු.1,800,000 ක් ලෙස සංශෝධනය කිරීමට භාණ්ඩාගාරය වෙත ඉල්ලුම් කර ඇත. මේ සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීම භාණ්ඩාගාරය මඟින් සිදු කරනු ලැබේ. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් (SA - 52) නිවැරදි කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කළ සමෘද්ධි/ අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථික ක්‍රමයක් සංවර්ධනය කිරීමේ වැඩ සටහන මඟින් ප්‍රතිලාභ ලැබූ ව්‍යාපෘතිලාභීන් 1000 ක් සිටින බව අමාත්‍යාංශය මඟින් ලබා දෙන ලද ප්‍රගති වාර්තාවේ සඳහන් වූ අතර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය සියයට සියයක් වන බව සඳහන් කර තිබුණ ද,නඩත්තු කර තිබූ ලිපිගොනුවෙහි ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලැබූ ව්‍යාපෘතිලාභීන්ගේ නම්, ලිපිනයන් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාළ ප්‍රතිලාභී නාම ලේඛනය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා ඇතත් සම්පූර්ණ ලේඛනය මෙතෙක් ලැබී නැත. එම ලේඛනය ලද පසු ඔබ වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නොපමාව අදාළ තොරතුරු ලබා ගෙන අදාළ ලිපිගොනු සම්පූර්ණ කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් 2021 දෙසැම්බර් 31 දිනට හිඟ කල්බදු කුලී රු.886,412,194 ක් නිරීක්ෂණය වූ අතර, 2021 කොටගල වැවිලි සමාගම සහ කුරුණෑගල වැවිලි සමාගම විසින් ගෙවිය යුතු හිඟ බදු කුලී මුදලේ එකතුව රු. 662,476,865 ක් විය. එම මුදල අයවිය යුතු මුළු ශේෂයෙන් සියයට 75 ක අගයකි. එම හිඟ අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කුරුණෑගල වැවිලි සමාගම 100% ක් රජය සතු වැවිලි සමාගමක් වන බැවින් හිඟ බදු මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුය.කොටගල වැවිලි සමාගම මඟින් හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නීතිපති වෙත දන්වා නෛතික ක්‍රියාමාර්ග ගන්නා මෙන් බදු දීමනාකරු වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත 2021.08.04 දින ලිඛිතව දන්වා ඇති අතර, 2022.04.05 හා 2022.08.29 දිනැති ලිපි මඟින් එහි ප්‍රගතිය විමසා ඇත. | ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් කඩිනමින් අදාළ බදු මුදල් සියල්ල අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණකයෙකු පත් කළ යුතු වුව ද, අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර හෝ අභ්‍යන්තර විගණකවරයකු පත් කර නොතිබුණි. | පුරප්පාඩුව පවතින අභ්‍යන්තර විගණක තනතුර සම්පූර්ණ කර දෙන මෙන් අංක SMTR/2/T&R/12/Vacancies හා 2021.07.22, 2021.09.14, 2021.10.28 හා 2022.02.03 දිනැති ලිපි මගින් රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ වෙත ඉල්ලීම් ලිපි යොමුකර ඇත. මෙම තනතුරට බඳවා ගැනීම සම්බන්ධ ලිපි යොමු කොට ඇතත් අභ්‍යන්තර විගණක තනතුර සම්පූර්ණ කර නොමැත. | අභ්‍යන්තර විගණකයකු පත් කර අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කළ යුතුය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 සැප්තැම්බර් 06 දිනැති අංක DMA/AMC/M/2021/2 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයට අදාළව එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | මෙම රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත වීමෙන් පසු මේ වන තෙක් අභ්‍යන්තර විගණකවරයෙකු නොසිටීම හේතුවෙන් අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිතව නොමැති අතර, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් තවදුරටත් එකී අභ්‍යන්තර විගණන කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුය. |